DOI : 10.31357/fhssmst.2011.00643

# කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෘට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ ඇගයීමක්

## (Evaluation of the Dragon Fruit Cultivation's Contribution to the Rural Development in the Kalutara District)

ගලබඩ ගමගේ පද්මා හේම කුමාරි විතාරණ

**ලියාපදිංචි අංකය: 1702SS2008001**

19 DEC 2011

MA 2011

# කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෲට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ ඇගයීමක්

## (Evaluation of the Dragon Fruit Cultivation's Contribution to the Rural Development in the Kalutara District)

ලියාපදිංචි අංකය: **1702SS2008001**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය,
නුගේගොඩ.

MA

2011

# කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෘට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ ඇගයීමක්

# (Evaluation of the Dragon Fruit Cultivation's Contribution to the Rural Development in the Kalutara District)


ගලබඩ ගමගේ පද්මා හේම කුමාරි විතාරණ

**ලියාපදිංචි අංකය: 1702SS2008001**


ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පර්යේෂණය සඳහා භූ ගෝල විද්‍යාව විෂයය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනයයි.

## අපේක්ෂකගේ ප්‍රකාශය

"මේ නිබන්ධයේ අන්තර්ගතය මහාචාර්ය ආර්. එම්. කේ. රත්නායක මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනික් ආයතනයකට හෝ වෙනත් උපාධියක් / ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් ප්‍රකාශ කරමි."

19/12/2011 ............................ Padma Vitharana ............................

දිනය අත්සන

## සුපරීක්ෂකගේ සහතිකය

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

........19/12/2011........ ..................................................

දිනය අත්සන

# ස්තුතිය!

- මෙම ශාස්ත්‍රපති පර්යේෂණ නිබන්ධය සැකසීමට පර්යේෂණ යෝජනාව සකස් කිරීමේ සිට අවසන් වන තෙක් නිරන්තරයෙන් මඟ පෙන් වූ ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක ගුරු පියාණන්ටත්,

- මාතෘකාව අනුමත කිරීමේ කාර්යයේ සිට මා දිරිමත් කළ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්, මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පිරිනමමි.

- එමෙන්ම, නිබන්ධය සැකසීමේදී නිරතුරුවම ඩ්‍රැගන් ෆෘට් වගාව පිළිබඳව තොරතුරු ලබාදුන් ලංකා ඩ්‍රැගන් ෆෘට් වගකරුවන්ගේ සංගමයේ සභාපති සහ සීකෝ කෘෂි සංවර්ධන පුද්ගලික සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂක දේශමාන්‍ය ආචාර්ය මනෝජ් කාරියවසම් මහතා ඇතුළු කාර්යය මණ්ඩලයටත්, කළුතර දිස්ත්‍රික්කයේ සියලුම ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ටත්,

- නිරන්තරයෙන් මා දිරිමත් කර ශක්තිය ධෛර්යය සැපයූ දෙමාපියන්ටත්,

- නිබන්ධනය සැකසීමට සහය වූ සියලූ දෙනාටත්,

මාගේ හෘදයාංගම ස්තුතිය!

# පෙරවදන

සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මය පවතින ශ්‍රී ලංකාවෙහි වෙළඳපොල ඉලක්ක කරගත් නව භෝග වගාවන් හඳුන්වා දීම නව ප්‍රවනතාවකි. මේ සඳහා රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය මහත් දායකත්වයක් සපයයි. 1998 වර්ෂයේ හඳුන්වා දුන් එක් නව භෝගයක් වන ඩ්‍රැගන් ෆෘට් පලතුර ශ්‍රී ලංකාව තුළ 2005 වර්ෂයේ සිට 'ලංකා ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ සංගමය' මගින් ව්‍යාප්ත කරමින් ඇත. පෞද්ගලික අංශය විසින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාප්ත කරන මෙම ඩ්‍රැගන් ෆෘට් වගාව මගින් කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ.

පළමු පරිච්ජේදය යටතේ මාතෘකාව හැඳින්වීම, පර්යේෂණයේ ගැටලුව, අධ්‍යයනයේ වැදගත්කම, අරමුණු සහ ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා කරයි. කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වෙමින් පවතින ඩ්‍රැගන් ෆෘට් වගාව ග්‍රාමීය ආර්ථිකයට ශක්තියක් සපයන බවක් දක්නට ලැබේ. මේ තුළ කුටුම්භ ආර්ථිකය ශක්තිමත් වීමත්, ඒ හරහා ග්‍රාමීය සංවර්ධනයත්, ප්‍රාදේශීය සංවර්ධනයත් ඇති විය හැකිය. අධ්‍යයනයේ වැදගත්කම යටතේ ග්‍රාමීය සංවර්ධනය, අන්තර් සම්බන්ධතා පිළිබඳව මෙතෙක් ඉදිරිපත් වී ඇති නිර්වචන, පර්යේෂණයන් කෙටියෙන් සාකච්ඡා කෙරිණි. මෙහි ප්‍රධාන අරමුණ ලෙස ග්‍රාමීය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඩ්‍රැගන් ෆෘට් වගාවෙහි බලපෑම පිළිබඳව අධ්‍යයනය කර ඇත. ක්‍රමවේදය යටතේ පර්යේෂණයට අදාලව අධ්‍යයන ප්‍රදේශය, නියැදිය, දත්ත රැස් කිරීමේ ක්‍රමශිල්ප සහ දත්ත විශ්ලේෂණය පිළිබඳව සාකච්ඡා කර ඇත.

දෙවන පරිච්ජේදය යටතේ පර්යේෂණ මාතෘකාවට අදාලව සාහිත්‍ය විමර්ෂණය සිදු කෙරේ. මෙහිදී ග්‍රාමීය සංවර්ධනය පිළිබඳව විශ්ලේෂණාත්මකව කරුණු දක්වා ඇත. 1948න් පසු ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන ඉතිහාසය, ග්‍රාමීය සංවර්ධනය සඳහා ගෙන ඇති වැඩසටහන්, ක්‍රමවේදයන් සවිස්තරව සාකච්ඡා කර ඇත. එමෙන්ම ග්‍රාමීය සංවර්ධන ක්‍රමෝපායන් වල සාර්ථක, අසාර්ථක තත්ත්වයන් ද අපනයන භෝග වගාවන් පිළිබඳව විස්තර කරයි. තවද, අපනයන විභවයක් ඇති ඩ්‍රැගන් ෆෘට් වගාව සහ ග්‍රාමීය සංවර්ධනය සමග වර්ධනය වන්නා වූ ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා පිළිබඳව කරුණු දක්වා ඇත.

තෙවන පරිච්ජේදය යටතේ අධ්‍යයන ප්‍රදේශය වන කළුතර දිස්ත්‍රික්කයෙහි භෞතික හා සමාජ, ආර්ථික පරිසරය පිළිබඳව කරුණු දක්වයි. මේ යටතේ ඩ්‍රැගන් ෆෲට් වගාව සඳහා කළුතර දිස්ත්‍රික්කයේ පවතින දේශගුණ තත්ත්වය කෙතරම් දුරට උචිත වී ඇත් දැයි සාකච්ඡා කර ඇත. කෘෂිකාර්මික පරිසරයකින් යුක්ත කළුතර දිස්ත්‍රික්කයෙහි සමාජ, ආර්ථික පරිසරය ද ඩ්‍රැගන් ෆෲට් වගාව සඳහා මැනවින් උචිත වී ඇත.

සිව්වන පරිච්ජේදය යටතේ පර්යේෂණය මගින් එක් රැස් කරගත් දත්ත ඇසුරෙන් කරුණු විමර්ෂණය කර ඇත. මෙහිදී කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෲට් වගාවේ පසුබිම පිළිබඳ සාකච්ඡා කරයි. ඩ්‍රැගන් ෆෲට් වගාකරුවන් වගා කිරීමේදී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම ග්‍රාමීය සංවර්ධනයට ඩ්‍රැගන් ෆෲට් වගාවෙන් සිදු කරනු ලබන දායකත්වය පිළිබඳව විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම, ඩ්‍රැගන් ෆෲට් වගාව ආශ්‍රිතව ග්‍රාමීය සංවර්ධනය සමග ගොඩ නැගෙන ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා පිළිබඳව සාකච්ඡා කර ඇත.

අවසන් පරිච්ජේදය මගින් පර්යේෂණය සිදු කිරීමෙන් සොයා ගන්නා ලද තොරතුරු ඔස්සේ නිගමන, යෝජනා ඉදිරිපත් කර ඇත. පර්යේෂණය ආරම්භයේ සිටම ඉදිරිපත් කල හැකි  නිගමන සහ එම නිගමන වලට අදාලව යෝජනා පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කරයි. මේ අනුව කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෲට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ පර්යේෂණයට අදාලව කරුණු පෙළ ගස්වා ඇත.

# සාරාංශය


ශ්‍රී ලංකාවට රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය විසින් නොයෙක් අවස්ථාවන්හිදී නව භෝග වර්ග හඳුන්වා දෙයි. මෙලෙස නව භෝග හඳුන්වා දීමේදී වෙළඳපොල ඉල්ලුම කෙරෙහි සහ ආර්ථික ලාභයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු වෙයි. ඒ අනුව හඳුන්වා දෙන ලද භෝග අතරින් විශාල ආදායමක් ලබා ගත හැකි ඩ්‍රැගන් ෆෘට් වගාව සුවිශේෂී වේ. ඩ්‍රැගන් ෆෘට් වගාකරුවාගේ ආදායම් මට්ටම ඉහළ යාම තුළින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ව්‍යවසායකත්වය සහ යටිතල පහසුකම් වර්ධනය වෙමින් පවතී. ඒ තුළින් ග්‍රාමීය සංවර්ධනය ඇති වේ. මෙම කරුණු ඔස්සේ කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෘට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳ ඇගයීමක් පර්යේෂණ ගැටලුව වේ.

මේ අනුව කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඩ්‍රැගන් ෆෘට් වගාවෙහි බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ යටතේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කෙරේ. තවද, කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෘට් වගාව ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය විශ්ලේෂණය කිරීම සහ ඒ ආශ්‍රිත වර්ධනය වන ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම සෙසු අරමුණු අතර වේ. මෙම පර්යේෂණය අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වන කළුතර දිස්ත්‍රික්කය තෝරා ගැණින. මේ යටතේ ඉඩම් වැඩිම ප්‍රමාණය, වැඩිම වගාකරුවන් සංඛ්‍යාව, වගාවේ ව්‍යාප්ති රටාව අනුව කළුතර දිස්ත්‍රික්කයේ සියලුම වගාකරුවන් ඇතුලත් වන පරිදි මෙම අධ්‍යයනය සිදු කර ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගෙන් බහුතරයක් මධ්‍යම සහ ඉහළ පන්තියට අයත් වන අතර ප්‍රධාන ආදායම් මාර්ගයට අමතරව නවීන තාක්ෂණික කෘෂිකර්මාන්තයෙහි නියැලෙන සුළු පිරිසක් වෙති. වෙනත් වගාවන්ට සාපේක්ෂව අඩු ශ්‍රම භාවිතය, කාබනික වගා ක්‍රමවේදයක් ඔස්සේ වගා කිරීම වැනි වාසීන් හේතුවෙන් ඔවුහු වගාව සඳහා යොමු වී සිටිති. ග්‍රාමීය ප්‍රදේශවල පදිංචි මෙම පිරිස එදිනෙදා අවශ්‍යතා සඳහා නාගරික මධ්‍යස්ථාන සමග ඉහළ මට්ටමින් සම්බන්ධතා පවත්වති. නමුත්, ප්‍රදේශයේ ජීවත් වන බහුතර ජනතාව මංසන්ධි, සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව පමණක් සම්බන්ධතා පවත්වති. නමුත් ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා මධ්‍යම සහ ඉහළ

පන්තිය පමණක් නොව දුප්පත් ජනතාව ද විශාල වශයෙන් වගා කිරීමට යොමු කර යුතු වේ.

ප්‍රදේශයේ බහුතරයක් ඉඩම් හිමි අයට වගාව සඳහා එක් වීමට නොහැකි වී ඇත්තේ ප්‍රමාණවත් ආයෝජන ශක්තිය නොමැති වීමෙනි. වෙනත් වගාවන්ට සාපේක්ෂව ඩ්‍රැගන් ෆෘට් වගාව සඳහා විශාල මුදලක් එකවර වැය කල යුතු වීම මෙයට ප්‍රධාන හේතුව වී ඇත. සමහර ආයෝජන ශක්තිය ඇති අයට වගා කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැත. මේ අනුව බොහෝ අය වගා කිරීමට කැමැත්තක් දැක් වුවද ඔවුනට පවතින ගැටලු හේතුවෙන් වගාව සඳහා යොමු වීමට නොහැකි වී ඇත.

මේ අනුව දිස්ත්‍රික්කය තුළ ප්‍රයෝජනයට නොගන්නා, ඉඩම් වගා නොකරන ඉඩම් ප්‍රශස්ත භූමි පරිහරණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. එමෙන්ම එක් එක් නව භෝගයන්ට ගැලපෙන ආකාරයේ සුදුසු ණය යෝජනා ක්‍රමයක් සැකසිය යුතු වේ. ඩ්‍රැගන් ෆෘට් පලතුරු සහ ශාකය ආශ්‍රිතව අතුරු නිෂ්පාදන සඳහා විභවතාවක් පවතින බැවින් ඒ සඳහා පවතින පර්යේෂණ කටයුතු අවසන් කොට කර්මාන්තශාලා මගින් නිෂ්පාදන කටයුතු කිරීමට අවශ්‍ය ආයෝජන රාජ්‍ය හෝ පෞද්ගලික අංශය මගින් ලබා දිය යුතු වේ. ඩ්‍රැගන් ෆෘට් පලතුර සහ අතුරු නිෂ්පාදන අපනයනය මගින් විශාල විදේශ විනිමයක් උපයා ගත හැකිය. එය සමස්ත ශ්‍රී ලංකාවේ ජාතික ආදායම වර්ධනය කිරීමට අවස්ථාවක් වන අතර ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයටත් ඒ තුළින් ප්‍රාදේශීය සංවර්ධනයටත් විශාල දායකත්වයක් සපයයි. මේ තුළ නිර්මාණය වන අන්තර් සම්බන්ධතා මගින් ග්‍රාමීය ජන ජීවිතවල පරිවර්තනයක් ද සිදු වෙමින් පවතින බව මෙම පර්යේෂණය මගින් හඳුනාගත හැකිය.

# පටුන

පිටුව

| | |
|---|---|
| අපේක්ෂකගේ ප්‍රකාශය | i |
| සුපරීක්ෂකගේ සහතිකය | ii |
| ස්තුතිය | iii |
| පෙරවදන | iv - v |
| සාරාංශය | vi - vii |
| පටුන | viii - xi |

## පළමු පරිච්ඡේදය - හැඳින්වීම

| | |
|---|---|
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 පර්යේෂණයේ ගැටලුව | 2 |
| 1.3 අධ්‍යයනයේ වැදගත්කම | 3 - 11 |
| 1.4 අරමුණු | 12 |
| 1.5 ක්‍රමවේදය | |
| 1.5.1 අධ්‍යයන ප්‍රදේශය | 12-14 |
| 1.5.2 නියැදිය තෝරා ගැනීම | 15 |
| 1.5.3 දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්ප | 16 - 17 |
| 1.5.4 දත්ත විශ්ලේෂණය | 17 |

## දෙවන පරිච්ඡේදය-ග්‍රාමීය සංවර්ධනය සහ ග්‍රාමීය සංවර්ධන ක්‍රමෝපායන්

| | |
|---|---|
| 2.1 හැඳින්වීම | 18 |
| 2.2 ග්‍රාමීය සංවර්ධනය නිර්වචනයන් | 19-22 |
| 2.3 ග්‍රාමීය සංවර්ධන ඉතිහාසය | 22-26 |
| 2.4 ග්‍රාමීය සංවර්ධන ක්‍රමෝපායන් | 26-39 |
| 2.5 කෘෂි භෝග වගාවන් | 39-45 |
| 2.6 අපනයන විභවයක් ඇති ඩ්‍රැගන් ෆෘට් වගාව | 45-52 |
| 2.7 ග්‍රාමීය සංවර්ධනය හා ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා | 52 – 57 |

## තුන්වන පරිච්ඡේදය - කළුතර දිස්ත්‍රික්කය


3.1 කළුතර දිස්ත්‍රික්කයේ භෞතික පරිසරය 59 - 68

3.2 සමාජ ආර්ථික පරිසරය 68 - 71


## සිව්වන පරිච්ඡේදය - කළුතර දිස්ත්‍රික්කයේ ඩැගන් ඍට් වගාව සහ ආර්ථික සංවර්ධනය


4.1 කළුතර දිස්ත්‍රික්කයේ ඩැගන් ඍට් වගාව 72 - 89

4.2 ඩැගන් ඍට් වගාව ආශ්‍රිත ගැටලු 90 - 97

4.3 ග්‍රාමීය සංවර්ධනයට ඩැගන් ඍට් වගාවෙන් සිදු කරනු ලබන දායකත්වය 98 - 110

4.4 ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා 110 - 118


## පස්වන පරිච්ඡේදය - නිගමන සහ යෝජනා


5.1 නිගමන 119 - 123

5.2 යෝජනා 124 - 126

ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය 127 – 132

උපග්‍රන්ථ

1. ප්‍රශ්නාවලිය i - ix
2. ඡායාරූප x - xiii

# වගු


| | පිටුව |
|---|---|
| 1.1 තෙත් කලාපයෙහි දිස්ත්‍රික්ක අනුව ධූගන් ෆෘට් වගාකරුවන් සංඛ්‍යාව - 2010 | 13 |
| 1.2 දිස්ත්‍රික්ක අනුව ඩ්‍රැගන් ෆෘට් වගාකරන භූමි ප්‍රමාණය | 15 |
| 2.1 තෝරාගත් ආසියාතික රටවල් කීපයක මානව සංවර්ධන දර්ශකය (HDI) | 27 |
| 2.2 ආසියාවේ ග්‍රාමීය මට්ටමේ දිළිඳුකමේ අසමාන ව්‍යාප්තිය | 28 |
| 2.3 ඒක පුද්ගල ඉඩම් අහිමි ජනගහනය හා කුලී ශ්‍රමිකයන් | 29 |
| 2.4 ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පළාත් අනුව - 2008 | 33 |
| 2.5 ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් (විවිධ අංශ අනුව) | 34 |
| 2.6 ශ්‍රී ලංකාවේ භූමි භාවිතය 1982-2007 | 40 |
| 2.7 නව වගා ස්ථාපනය දිස්ත්‍රික්ක අනුව (2005-2008) නව වගා (හෙක්.) | 42 |
| 2.8 ප්‍රතිඔක්සිකාරක අගයන් තෝරාගන්නා ලද නිවර්තන පලතුරු කිහිපයක් ඇසුරෙන් | 47 |
| 2.9 රතු ඩ්‍රැගන් ෆෘට් 100gක අන්තර්ගත වන පෝෂණ අගයයන් | 48 |
| 2.10 ඩ්‍රැගන් ෆෘට් වගාව සඳහා උචිත තත්වයන් | 50 |
| 2.11 ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රිද්මය | 51 |
| 2.12 නාගරික ග්‍රාමීය අන්තර් සම්බන්ධතා | 54 |
| 3.1 කළුතර දිස්ත්‍රික්කයෙහි උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයෙහි වෙනස්වීම 2006 - 2008 දක්වා | 64 |
| 3.2 කළුතර දිස්ත්‍රික්කයේ මාසික වර්ෂාපතනය (මිලිමීටර්) 2005 - 2008 | 66 |
| 3.3 සංගණන වර්ෂය අනුව ශ්‍රී ලංකාවේ හා කළුතර දිස්ත්‍රික්කයේ ජනගහනය හා ජනගහනය වර්ධනය වීමේ ප්‍රතිශතය 1871 - 2001 | 68 |
| 3.4 කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය භූමි පරිභෝග රටාව - 2008 | 69 |
| 4.1 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ මාසික ආදායම් තත්ත්වය - 2010 | 77 |
| 4.2 ඩ්‍රැගන් ෆෘට් අක්කර එකක වගාවක් සිදු කිරීමට ආයෝජනය කළ යුතු මුදල - 2010 | 80 |
| 4.3 ඩ්‍රැගන් ෆෘට් වගාවෙන් ලැබෙන ලාභය - 2010 | 81 |
| 4.4 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන් භූමි ප්‍රමාණය අනුව ආයෝජනය කර ඇති මුදල් - 2010 | 91 |

## රූප සටහන්

| | පිටුව |
|---|---|
| 1.1 රටක සංවර්ධන සැලසුම්කරණය | 4 |
| 1.2 දත්ත හා තොරතුරු රැස්කිරීම | 17 |
| 2.1 විමධ්‍යගත අයවැය සැලසුම් සම්බන්ධීකරණය හා ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය | 25 |
| 2.2 ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතියෙහි අන්තර් ක්‍රියාකාරීත්වය | 39 |
| 2.3 ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා වර්ධනය | 53 |
| 2.4 කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොලට ගලා යාම | 56 |
| 3.1 කොන්ක්‍රිට් ආධාරකයට හොඳින් පුහුණු කරන ලද පුෂ්ප සහ ඵල සහිත ඩ්‍රැගන් ෆෘට් ශාකයක් | 59 |
| 3.2 භෞතික භූමි භාවිත වර්ගීකරණය | 61 |
| 4.1 අනාගත අපනයනයන් සඳහා ජ්‍යාතන්තර කාබනික හා සත්ත්ව සහතිකයන් යටතේ අපනයනයන් සඳහා සැකසූ ඩ්‍රැගන් ෆෘට් පලතුර | 104 |
| 4.2 කළුතර දිස්ත්‍රික්කයෙහි ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ ග්‍රාමීය නාගරික අන්තර් සම්බන්ධතා පුළුල් වීම | 116 |

## සිතියම්

| | පිටුව |
|---|---|
| 1.1 තෙත් කලාපයෙහි ඩ්‍රැගන් ෆෘට් වගාව දිස්ත්‍රික්ක අනුව වගාකරුවන්ගේ ව්‍යාප්තිය - 2010 | 14 |
| 2.1 ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය අසමතුලිතතාවය - හරය හා පරිධිය කලාපය | 32 |

## ප්‍රස්තාර


පිටුව

4.1 කළුතර දිස්ත්‍රික්කයෙහි ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ අධ්‍යාපන මට්ටම - 2010 73

4.2 කළුතර දිස්ත්‍රික්කයෙහි ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ රැකියා තත්ත්වය - 2010 76

4.3 කළුතර දිස්ත්‍රික්කයෙහි ඩ්‍රැගන් ෆෘට් වගා භූමි සංඛ්‍යාව - 2010 78

4.4 කළුතර දිස්ත්‍රික්කයෙහි ඩ්‍රැගන් ෆෘට් වගාවේ ව්‍යාප්තියෙහි වර්ධනය 2004 - 2006 86

4.5 ඩ්‍රැගන් ෆෘට් වගා පිළිබඳව දැනුවත් වීමට මාසිකව පැමිණි සංඛ්‍යාව - 2010 87

4.6 ඩ්‍රැගන් ෆෘට් අස්වැන්න සංගමයෙහි මූලස්ථානයට ප්‍රවාහනය - 2010 94

4.7 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ ආදායම - 2010 97

4.8 ඩ්‍රැගන් ෆෘට් වගාව ආරම්භක වර්ෂයේ නිර්මාණය වන ඍජු හා වක්‍ර රැකියා (අක්කර එකක් සඳහා) 101

4.9 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන්ගේ වත්කම් - 2010 106

4.10 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන් තම අවශ්‍යතා සපුරා ගැනීම - 2010 110

4.11 ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන් බෙහෙත් ලබා ගැනීම - 2010 114


## සිද්ධි අධ්‍යයන


පිටුව

4.1 සිද්ධි අධ්‍යයන 1 77

4.2 සිද්ධි අධ්‍යයන 2 81

4.3 සිද්ධි අධ්‍යයන 3 85 - 86

4.4 සිද්ධි අධ්‍යයන 4 101

4.5. සිද්ධි අධ්‍යයන 5 101

4.6. සිද්ධි අධ්‍යයන 6 109

4.7. සිද්ධි අධ්‍යයන 7 117